බෞද්ධ පිළිවෙත් සුරකින දැහැමි සමාජයක්


බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

Department of Buddhist Affairs

பௌத்த மத அலுவல்கள் திணைக்களம்


# කාර්යසාධන වාර්තාව

## Performance Report - செயற்திட்ட அறிக்கை

## 2015




"දහම්පාය" 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,කොළඹ 07.

"Dahampaya", 135, Srimath Anagarika Dharmapala Mawatha, Colombo 07.

தஹம்பாய 135. ஸ்ரீமத் அனாகாரிக்க தர்மபால மாவத்தை. கொழும்பு -07

# දැක්ම

බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් කරා.....

# මෙහෙවර ප්‍රකාශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා
කර්තව්‍යයන් මැනවින් සංවිධානය කරලීම තුළින්,
දේශීය හා විදේශීය බෞද්ධ ජනතාවගේ ප්‍රබෝධයට
හේතු වන දැහැමි ගුණගරුක සමාජයක් බිහි කර
ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම
සාක්ෂාත් කරලීම.....

කාර්යසාධන වාර්තාව
2015



# අරමුණු

ථේරවාදී බුදු දහම ආරක්ෂා කිරීම, පෝෂණය කිරීම හා ප්‍රචලිත කිරීම.

සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම හා ඒවා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීම.

බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කරලීම.

බුද්ධ ශාසනය හා අනාදිමත් කාලයක සිට බැඳුණු අනෙකුත් මතවාදයන් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.

බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා සංවර්ධනය කිරීම.

සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම හා මෙහෙයවීම.



කාර්යසාධන වාර්තාව

2015

# පටුන


| | පිටු අංක |
|---|---|
| දැක්ම | 01 |
| මෙහෙවර ප්‍රකාශය | 01 |
| අරමුණු | 02 |
| බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය | 05 |
| හැඳින්වීම | 06 |

**01.** **පාලන අංශය** **09 - 13**

01.1. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන
01.2. දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව
01.3. 2015 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

**02.** **විහාර දේවාලගම් අංශය** **14 - 16**

02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම
02.2. බස්නායක නිලමේවරුන් පත් කිරීම
02.3. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට සහාය වීම
02.4. රත්නපුර හා මහනුවර ප්‍රාදේශීය කාර්යාල හා සම්බන්ධීකරණ කටයුතු
02.5. විහාරස්ථාන ගිණුම් වල මුදල් සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීම
02.6. පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය
02.7. විහාරස්ථාන වල පවතින ඉඩම් ආරවුල් නිරාකරණය

**03.** **දහම් පාසල් අංශය** **17 - 26**

03.1. දහම් පාසල් ලියාපදිංචිය
03.2. දහම් පාසල් ගුරු ශිෂ්‍ය තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම
03.3. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම
03.4. 120 වන දහම් පාසල් දිනය සැමරීම
03.5. ගුරුභවතුන් සඳහා පුස්තකාල දීමනා, නිල ඇඳුම් සහ මාසික දීමනා ලබා දීම
03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය
03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම
03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය
03.9. බුද්ධ ජයන්ති පොත් හල

**04.** **සංවර්ධන අංශය** **27 - 32**

04.1. දුෂ්කර විහාරස්ථාන සඳහා ආධාර ලබා දීම
04.2. සිල්මාතා ආරාම වැඩිදියුණු කිරීම
04.3. උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීම
04.4. සිව්පස ආධාර ලබා දීම
04.5. බෞද්ධ ලේඛකයින් දිරිගැන්වීම
04.6. දහම් පාසල් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම
04.7. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම
04.8. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරීම
04.9. ජාතික උත්සව සංවිධානය කිරීම




**05.** **ව්‍යාපෘති අංශය** **33 - 34**
- 05.1. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන
- 05.2. දහම් සරසවිය පාඨමාලාව
- 05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම
- 05.4. බෞද්ධ විශ්වකෝෂය
- 05.5. ත්‍රිපිටක පරිවර්තනය

**06.** **භික්ෂු ලියාපදිංචි අංශය** **35**
- 06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම

**07.** **තොරතුරු අංශය** **36 - 37**
- 07.1. ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික තොරතුරු ඒකරාශී කිරීම
- 07.2. තොරතුරු යාවත්කාලීන කිරීම
- 07.3. පාලි ප්‍රවර්ධන පාඨමාලාව
- 07.4. මාධ්‍ය කටයුතු සහ වෙනත් සේවාවන්

**08.** **ගිණුම් අංශය** **38 – 39**

**09.** **අභ්‍යන්තර විගණන අංශය** **40**

**10.** **බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල** **41 – 45**
- 10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය
- 10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

# බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බුද්ධ ශාසනය රැක ගැනීම, පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමේ භාරදූර රාජ්‍ය වගකීම බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එම උදාර වගකීම ඉටු කිරීම සඳහා මනා දැක්මකින් යුතුව කටයුතු කිරීමට සෑම විටම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම සතුටට කරුණකි.

අපගේ දැක්ම වනුයේ බොදු පිළිවෙත් සුරකින සමාජයක් ගොඩනැගීමයි. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ කාර්යයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. විශේෂයෙන් භෞතික අංශයේ සංවර්ධනයටත් වඩා වැදගත් වනුයේ ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කර ගැනීමයි. එම ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම සඳහා ඇප කැපව කටයුතු කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයි.


පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා මග පෙන්වන ප්‍රධාන ආයතනය වනුයේ විහාරස්ථානයයි. විහාරස්ථාන හා දහම් පාසල් භෞතික අංශයෙන් සංවර්ධනය කරන අතරම පුද්ගලයා හා විහාරස්ථාන අතර අන්‍යෝන්‍ය සබඳතාව ඇති කරලීම සඳහා ක්‍රියා කිරීම විශේෂත්වයකි. මෙම වසර තුළ දී පංචශීල ප්‍රතිපත්තිය මුල් කර ගත් පිළිවෙත් සුරකින සමාජයක් ගොඩ නැංවීමට දෙපාර්තමේන්තුවේ සෑම අංශයක් ම කැපවී ක්‍රියා කිරීම අගය කරමි. ඒ සඳහා සහාය දැක්වූ සියළුම අංශවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සැමට මාගේ ප්‍රණාමය පුද කරමි.

චන්ද්‍රප්‍රේම ගමගේ
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

# හැඳින්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාමට අදාළ කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටුකරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහාය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියළුම සාමණේර/ උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන අංශ ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත.




විහාර දේවාලගම් ආඥා පනතට අදාළ කටයුතු දුර බැහැර සිද්ධස්ථාන වාසී ස්වාමීන් වහන්සේලාට ඉටුකර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශීය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.

01. ශාසනාරක්ෂක මණ්ඩල පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.

02. දහම් පාසල් කටයුතු.

   i. දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
   ii. දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
   iii. දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.



iv. දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවීම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.

v. දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම.

vi. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාව ලබා දීම

vii. දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරීම.

viii. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

ix. දහම් පාසල් ගොඩනැගිලි සඳහා ආධාර ලබා දීම.

x. දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ බෙදා දීම.

xi. අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතික පත් ප්‍රදානය කිරීම.

xii. දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගයක් පැවැත්වීම.

xiii. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමගත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමගත් ඒකාබද්ධ ව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

03. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු, ආයතන කටයුතු, ගොඩනැගිලි නඩත්තුව, තැපැල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටු කිරීම.

04. ආයතනයේ වියහියදම් පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටු කිරීම.

05. විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන්/ භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.

06. බෞද්ධ සිද්ධස්ථාන වල දේපළ පරිපාලනයට අවශ්‍ය සහාය ලබා දීම. මෙහි දී සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සඟ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපළ වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් ඉටු කිරීම.

07. දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරාධිපති තනතුර පිළි ගැනීම.

08. විහාරස්ථාන ආධාර, සිව්පස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම.

09. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාළ කටයුතු.

10. ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම.

11. නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම.

12. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම.

13. විහාරස්ථාන සඳහා සහන ගාස්තු මත දුරකථන, ජලය, විදුලිය වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම.

14. නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු.

15. කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම.

16. නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/ කම්කරු)

17. ලේඛකාධාර යටතේ පොත්පත් මිලදී ගැනීම් කටයුතු.

18. දස සිල් මාතාවන් පිළිබඳ කටයුතු
    i. ආරාම ලියාපදිංචි කිරීම
    ii. හැඳුනුම්පත් නිකුත් කිරීම.
    iii. අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු.
    iv. රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම.

19. භික්ෂූන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා ලියාපදිංචිය.

20. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම.

21. විහාරස්ථාන සතු දේපළ හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු.

ඉහත කාර්යයන්ට අමතරව වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ හා සමස්ත ලංකා සිසු නිපුණතා තරඟය පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උලෙළ පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කළ හැකිය.

# 01


# පාලන අංශය

දෙපාර්තමේන්තුව තුළ ඇති පාලන අංශය මඟින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කළ හැකිය.

- දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා ඒ හා සම්බන්ධ සියලු කටයුතු.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- වාහන නඩත්තු කිරීම ඇතුළුව වාහන විෂයයට අදාළ සියළුම රාජකාරි.
- ජල, විදුලි, දුරකථන බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- තැපැල සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- තනතුරු අනුමත කර ගැනීම, බඳවා ගැනීම, බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- නිලධාරීන්ගේ පැමිණීම, නිවාඩු ආදිය සම්බන්ධ සියළුම රාජකාරි.
- නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- අතිකාල, ගමන් වියදම් වලට අදාළ වවුචර භාර ගැනීම හා අනුමත කිරීම.
- නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.
- දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම.
- ගොඩනැඟිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය)
- මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- දිස්ත්‍රික් සමායෝජක නිලධාරී රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.

කාර්යසාධන වාර්තාව
2015

## 01.1. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



## 01.2. දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

**(2015.12.31 දිනට)**

| තනතුර | අදාළ සේවය | ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ | I විශේෂ ශ්‍රේණිය | 1 | 1 | - |
| බෞද්ධ කටයුතු කොමසාරිස් (දහම් පාසල්) | ශ්‍රී.ලං.ප.සේ | I | 1 | 1 | - |
| බෞද්ධ කටයුතු කොමසාරිස් (මහනුවර) | ශ්‍රී.ලං.ප.සේ | I | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | 1 | 1 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | 1 | 1 | - |
| නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | ශ්‍රී.ලං.ප.සේ | II/ III | 4 | 4 | - |
| ගණකාධිකාරී II/ III | ශ්‍රී.ලං.ග.සේ | II/ III | 1 | 1 | - |
| නීති නිලධාරී | දෙපා. | | 1 | 1 | - |
| උප කර්තෘ (බෞද්ධ විශ්වකෝෂය) | දෙපා. | | 1 | 1 | - |
| පරිපාලන නිලධාරී | රා.කළ.ස.සේ | අධි පන්තිය | 1 | 0 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස.සේ | I/ II/ III | 45 | 25 | 20 |
| ව්‍යාපෘති නිලධාරී | දෙපා. | | 5 | 4 | 1 |
| බෞද්ධ කටයුතු සමායෝජක | දෙපා. | | 481 | 465 | 16 |
| ගිණුම් සහකාර | දෙපා. | | 2 | 2 | - |
| සංවර්ධන සහකාර | දෙපා. | | 39 | 38 | 1 |
| සංවර්ධන නිලධාරී | සං.නි.සේ | | 204 | 151 | 53 |
| සහයක නීති නිලධාරී | දෙපා. | | 2 | 1 | 1 |
| බංගලා භාරකරු (චාරිකාරාමය) | දෙපා. | | 1 | 1 | - |
| රියදුරු | ඒ.රි.සේ | I/ II/ III | 12 | 11 | 1 |
| කාර්යාල සේවක | කා.සේ.සේ | I/ II/ III | 20 | 19 | 1 |
| ලොරි සහයක | දෙපා. | | 2 | 0 | 2 |
| බංගලා භාරකරු සහයක | දෙපා. | | 1 | 1 | - |



## 01.3. 2015 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

1. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සහ සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා 2016 වර්ෂය සඳහා ස්ථාන මාරු ලබා දීම සඳහා කටයුතු සිදු කිරීම.

2. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය හරහා පත්වීම් ලබන සංවර්ධන නිලධාරී 75ක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

3. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සඳහා කාර්යාලීය ගමන් මළු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

4. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සහ නීති නිලධාරී සහ ගණකාධිකාරී කාර්යාල සඳහා නව දුරකථන සබඳතා දෙකක් ලබා ගැනීම.

5. මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතින බෞද්ධ විශ්වකෝෂයේ සම්පාදන කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ කර්තෘ තනතුරු 03ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය. ඒ සම්බන්ධ බඳවා ගැනීමේ ඉදිරි කටයුතු බුද්ධශාසන අමාත්‍යාංශය හරහා සිදු කෙරෙමින් පවතී.

6. දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පවත්වා ගෙන යාම, ඒවායේ අලුත්වැඩියා කටයුතු සහ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු සිදු කිරීම.

2015.12.31 දිනට දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පහත පරිදි වේ.

- වෑන් රථ - 04
- ලොරි රථ - 03
- කාර් රථ - 03
- කැබ් රථ - 02

7. බෞද්ධ විශ්වකෝෂයේ උප කර්තෘ තනතුර උසස් කිරීමේ පරිපාටියට අදාළ කටයුතු සිදු කිරීම.

8. දෙපාර්තමේන්තු තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව මත දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සහනදායී පදනම මත ලැප්ටොප් පරිගණක ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන ලදි.

9. දෙපාර්තමේන්තු නිලධාරීන් 98 දෙනෙක් සඳහා අග්‍රහාර රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දීම.

කාර්යසාධන වාර්තාව 2015

10. දෙපාර්තමේන්තු නිලධාරීන් 56 දෙනෙකු සඳහා රාජකාරි හැඳුනුම්පත් සකස් කර දීම.

11. මහානායක වාරිකාරාමය සහ “දහම්පාය“ ගොඩනැඟිල්ලේ පිටුපස ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම

12. දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් සඳහා විශේෂ නේවාසික පුහුණු වැඩමුළු පැවැත්වීම.

| පැවැත්වූ දිනය | පැවැත්වුණු ස්ථානය | වැඩමුළුවේ ඇතුළත් වූ ප්‍රධාන මාතෘකා |
|---|---|---|
| 2015.02.27 සහ 28 | ශ්‍රී ලංකා යූත් ෆාම් පුහුණු මධ්‍යස්ථානය - බටංගල | ❖ විහාර දේවාලගම් පනත පිළිබඳ හැඳින්වීම. |
| 2015.03.13 සහ 14 | ඌව කළමනාකරණ සංවර්ධන ආයතනය | ❖ කාල කළමනාකරණය හා කාර්යාලීය අවශ්‍යතා සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය. |
| 2015.06.26 සහ 27 | වනජීවී පුහුණු කේන්ද්‍රය - ගිරිතලේ | |
| 2015.07.17 සහ 18 | විහාරමහාදේවී මානව සංවර්ධන කේන්ද්‍රය - මිරිජ්ජවිල | |
| 2015.10.16 සහ 17 | ශ්‍රී ලංකා යූත් ෆාම් පුහුණු මධ්‍යස්ථානය - බටංගල | ❖ කාර්යාල ක්‍රම සහ ගිණුම් ක්‍රම |

13. 2015 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ මැතිවරණ රාජකාරි සිදු කිරීම.

14. දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

# 02

# විහාර දේවාලගම් අංශය

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම විහාර දේවාලගම් අංශයට පැවරී ඇති අතර එමගින් බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය හා චිරස්ථිතිය තහවුරු වී ඇත.

## 02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම.

දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරාධිපති තනතුර පිළි ගැනීමේ කටයුතු විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලැබේ.

2015 වසර වන විට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා අයදුම්කළ විහාරස්ථාන සංඛ්‍යාව 11,345 ක් වන අතර ලියාපදිංචි කළ විහාරස්ථාන සංඛ්‍යාව 8,233 කි.

විහාරස්ථාන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම තුළින් ඒවායේ නීතිමය වලංගුභාවය මෙන්ම ආගමික සංවර්ධන කටයුතු සඳහා ද වඩාත් පිටිවහලක් ලැබේ.

## 02.2. බස්නායක නිලමේවරුන් පත් කිරීම.

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් ගේ පාලනයේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන්/ භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියෙන් පාලනය වන දේවාල සඳහා 2015 වර්ෂයේ ඡන්ද පවත්වා බස්නායක නිලමේවරුන් 19 දෙනෙකු පත් කර ඇත. මීට අමතරව ශ්‍රී දළදා මාළිගාව සඳහා දිය වඩන නිලමේවරයෙකු ද පත් කරන ලදි.

මෙමඟින් විහාර දේවාල පනත අනුව බස්නායක නිලමේවරුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම බෞද්ධ කටයුතු කොමසාරිස් තුමාට බලය ලැබීම තුළින් වඩාත් විනිවිද භාවයෙන් කාර්යයන් ඉටු කිරීමට හැකි වී තිබේ.

## 02.3. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට සහාය වීම.

මෙහිදී සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බද්දු පදනම මත ලබා දීම, එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය පරිදි අනුමැතිය ලබා දීම, සහ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිතභාවය සඳහා කටයුතු යෙදීම, අනුමාන හා අර්ධ වාර්ෂික ආදායම් වාර්තා ලබා ගැනීම තුළින් ආදායම් වියදම් විමර්ශනය සිදු කිරීම, 2015 වසර තුළ එවැනි කාර්යයන්ගේ සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කරයි.

2015 වසරේ දී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ඇතිව බෞද්ධ සිද්ධස්ථාන සන්තක ඉඩම් බදු දුන් අවස්ථා 171 කි.

## 02.4. රත්නපුර හා මහනුවර ප්‍රාදේශීය කාරයාල හා සම්බන්ධීකරණ කටයුතු

රත්නපුර හා මහනුවර කාර්යාල වලට අයත් දිස්ත්‍රික්ක වල විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ කටයුතු පමණක් ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරන අතර විහාර දේවාලගම් පනතේ අනෙකුත් පවරා ඇති රාජකාරි ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක වේ. මේ තුළින් මෙම දිස්ත්‍රික්ක වල ස්වාමීන්වහන්සේලාට හා බස්නායක නිලමේවරුන්ට වඩාත් පහසුවෙන් ඉහත කාර්යයන් ඉටුකර ගැනීමට අවස්ථාව සැළසී ඇත.

නුවරඑළිය, මාතලේ, මහනුවර යන දිස්ත්‍රික්ක සඳහා මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ ද, රත්නපුර, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්ක රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයෙන් ද, බදු දීමේ හා ඊට අදාළ ඉඩම් හා අනෙකුත් ගැටලු කටයුතු දැනට සිදුකරනු ලබන අතර අනෙක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එම කටයුතු සිදු කෙරේ. මෙකී ඉඩම් බදු දීමෙන් ලැබෙන ආදායම එම විහාරස්ථාන වල සංවර්ධන කටයුතු මෙන්ම ස්වාමීන් වහන්සේලාගේ ආගමික හා අධ්‍යාපන කටයුතු සඳහා ද වැය කරනු ලබයි.

## 02.5. විහාරස්ථාන ගිණුම් වල මුදල් සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීම.

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ගිණුම් වල තැන්පත්ව ඇති විහාරස්ථාන වලට අයත් මුදල් කොමසාරිස් ජනරාල් තුමාගේ අධීක්ෂණය අනුමැතිය යටතේ විහාර සංවර්ධන කටයුතු හා අනෙකුත් වියදම් සඳහා මුදා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.




2015 වර්ෂය තුළ විහාරස්ථාන 101 ක් සඳහා මුදල් නිදහස් කළ අතර මේ මඟින් විහාරස්ථාන සංවර්ධන කටයුතු සඳහා එම මුදල් යෙදවූ ආකාරය සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීම සඳහා විහාරස්ථාන සංවර්ධනය වූ ආකාරය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් ලබා ගැනීමටත් කටයුතු කර ඇත.

2015 වර්ෂය තුළදී ලියාපදිංචි විහාරස්ථාන 8233 දක්වා වර්ධනය වී ඇත. මේ මගින් බලාපොරොත්තු වන්නේ රජයෙන් ලැබෙන ආධාර මුදල් නිසි පරිදි ලබා ගැනීම ආදී කටයුතු පහසු කරලීමයි.

විහාරස්ථාන සතු ඉඩම් වල අනවසර පදිංචිකරුවන් අදාළ ප්‍රාදේශීය ලේකම් හරහා දැනුවත් කොට එම ඉඩම් වලින් ලැබෙන ආදායම් විහාරස්ථානයට ලබා දීමට කටයුතු සිදු කිරීම සඳහා මැදිහත් වීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

## 02.6. පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය

ප්‍රධාන කාර්යාලයෙන් කටයුතු කිරීම සඳහා 4(1) පාලනය යටතේ ඇති දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය හා දෙවුන්දර රජමහා විහාරය, සීනිගම දේවාලය, කැළණිය රජමහා විහාරය, ජයසේකරාරාමය යන ස්ථාන වල පඬුරු මුදල් ආදායම් අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන අතර මේ සඳහා ප්‍රධාන කාර්යාලයෙන් නිලධාරීන් දෙදෙනෙකු හා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරියෙක් ද ඇතුළුව මෙම කටයුතු සිදු කරයි. විනිවිද පෙනෙන ආකාරයට පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය කිරීම තුළින් අයථා පරිහරණයෙන් තොරව පඬුරු මුදල් ගිණුම්ගත කිරීමට අවස්ථාව සැළසී ඇත.

තවද මහනුවර හා රත්නපුර කාර්යාලය යටතේ පාලනය වන දිස්ත්‍රික්කයන්හි පවත්නා විහාර හා දේවාල රාශියක් ඇත. ඒවායේ එම කටයුතු ඉහත සඳහන් ආකාරයට එම ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කෙරේ.

## 02.7. විහාරස්ථාන වල පවතින ඉඩම් ආරවුල් නිරාකරණය

විහාරස්ථාන වල පවතින විහාරාධිපති ධූර සම්බන්ධ ගැටලු මෙන් ම ඉඩම් ගැටලු සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් දැනුවත් කොට එකී වාර්තා පදනම් කොට එම ගැටලු විසඳීමට කටයුතු කරනු ලබයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශයට යොමු කොට ඒ සඳහා අවශ්‍ය නිගමන ලබා ගැනීමට කටයුතු කර ඇත.

2015 වසර තුළදී එවැනි විහාරස්ථාන ගැටලු 38ක් නිරාකරණය කර ඇති අතර, ඇතැම් ආරවුල් නීතිමය ගැටලු මත ඉදිරියේ දී විසඳීමට අපේක්ෂා කෙරේ.

# 03


# දහම් පාසල් අංශය

## 03.1. දහම් පාසල් ලියාපදිංචිය

දරුවන්ගේ සදාචාරාත්මක ගුණ දහම් වර්ධනය කිරීමට දහම් පාසල මහෝපකාරී වේ. ඒ අරමුණින් ආරම්භ කරන ලද සියලුම දහම් පාසල් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලබයි. ලියාපදිංචියෙන් අනතුරුව දහම් පාසල පවත්වාගෙන යාමට අවශ්‍ය පෙළපොත්, නාමලේඛන ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සඳහා වාර්ෂික තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබයි.

| ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව | තොරතුරු ලබා දී ඇති සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| **10,720** | 9,857 | 126,039 | 2,113,454 |


වගුව 03.1 - දහම් පාසල් ලියාපදිංචිය පිළිබඳ තොරතුරු





ප්‍රස්තාරය 03.1 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය

## 03.2. දහම් පාසල් ගුරු, ශිෂ්‍ය තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම.

දිවයින පුරා ඇති දහම් පාසල් වල ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සහ ගුරුවරුන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. එමගින් දහම් පාසල් ගුරුවරුන් හා ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සැළසුම් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැළසේ.




ප්‍රස්තාරය 03.2 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය




ප්‍රස්තාරය 03.3 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරු සංඛ්‍යාවේ වර්ධනය





වාර්ෂිකව දහම් පාසල් ගුරුවරුන්ගේ පුස්තකාල දීමනා සහ නිල ඇඳුම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම සහ පෙළ පොත් ලබා දීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාවන් ගණන් ගැනීම සඳහා වෙනත් වැඩසටහන් වලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම සංඛ්‍යා ලේඛන වාර්ෂිකව ලබා ගැනේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවිදි | | | සිල්මාතා | | | පිරිමි | | | ගැහැණු | | | මුළු එකතුව | මුළු එකතුව | පුස්තකාල දීමනා හිමි මුළු ගණන | නිල ඇඳුම් හිමි මුළු ගණන | දීමනාව | මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | | | | | | |
| 1 | කොළඹ | 1186 | 265 | 1451 | 32 | 7 | 39 | 2208 | 593 | 2801 | 5641 | 1696 | 7337 | **11628** | 9067 | 7849 | 2561 | 2,000.00 | 18,134,000.00 |
| 2 | ගම්පහ | 1121 | 247 | 1368 | 51 | 8 | 59 | 1861 | 524 | 2385 | 6138 | 1911 | 8049 | **11861** | 9171 | 7999 | 2690 | 2,000.00 | 18,342,000.00 |
| 3 | කළුතර | 763 | 156 | 919 | 27 | 2 | 29 | 1328 | 368 | 1696 | 4299 | 1411 | 5710 | **8354** | 6417 | 5627 | 1937 | 2,000.00 | 12,834,000.00 |
| 4 | මහනුවර | 1165 | 177 | 1342 | 41 | 7 | 48 | 1283 | 408 | 1691 | 5546 | 1874 | 7420 | **10501** | 8035 | 6829 | 2466 | 2,000.00 | 16,070,000.00 |
| 5 | මාතලේ | 368 | 65 | 433 | 10 | 0 | 10 | 418 | 161 | 579 | 2052 | 1007 | 3059 | **4080** | 2848 | 2470 | 1233 | 2,000.00 | 5,696,000.00 |
| 6 | නුවරඑළිය | 257 | 64 | 321 | 6 | 0 | 6 | 293 | 159 | 452 | 1419 | 638 | 2057 | **2836** | 1975 | 1712 | 861 | 2,000.00 | 3,950,000.00 |
| 7 | ගාල්ල | 809 | 149 | 958 | 11 | 2 | 13 | 1313 | 423 | 1736 | 4342 | 1697 | 6039 | **8746** | 6475 | 5655 | 2271 | 2,000.00 | 12,950,000.00 |
| 8 | මාතර | 726 | 145 | 871 | 6 | 0 | 6 | 1027 | 262 | 1289 | 3698 | 1256 | 4954 | **7120** | 5457 | 4725 | 1663 | 2,000.00 | 10,914,000.00 |
| 9 | හම්බන්තොට | 486 | 110 | 596 | 13 | 1 | 14 | 660 | 204 | 864 | 2690 | 1279 | 3969 | **5443** | 3849 | 3350 | 1594 | 2,000.00 | 7,698,000.00 |
| 10 | වව්නියාව | 17 | 3 | 20 | 0 | 0 | 0 | 22 | 10 | 32 | 122 | 43 | 165 | **217** | 161 | 144 | 56 | 2,000.00 | 322,000.00 |
| 11 | මුලතිව් | 6 | 0 | 6 | 1 | 0 | 1 | 19 | 9 | 28 | 70 | 51 | 121 | **156** | 96 | 89 | 60 | 2,000.00 | 192,000.00 |
| 12 | අම්පාර | 207 | 44 | 251 | 6 | 2 | 8 | 247 | 101 | 348 | 1176 | 531 | 1707 | **2314** | 1636 | 1423 | 678 | 2,000.00 | 3,272,000.00 |
| 13 | ත්‍රිකුණාමලය | 95 | 25 | 120 | 0 | 0 | 0 | 139 | 48 | 187 | 565 | 260 | 825 | **1132** | 799 | 704 | 333 | 2,000.00 | 1,598,000.00 |
| 14 | කුරුණෑගල | 1235 | 223 | 1458 | 86 | 12 | 98 | 1773 | 514 | 2287 | 7151 | 2568 | 9719 | **13562** | 10245 | 8924 | 3317 | 2,000.00 | 20,490,000.00 |
| 15 | පුත්තලම | 250 | 50 | 300 | 7 | 2 | 9 | 486 | 159 | 645 | 1560 | 658 | 2218 | **3172** | 2303 | 2046 | 869 | 2,000.00 | 4,606,000.00 |
| 16 | අනුරාධපුරය | 634 | 134 | 768 | 28 | 5 | 33 | 809 | 345 | 1154 | 3540 | 1921 | 5461 | **7416** | 5011 | 4349 | 2405 | 2,000.00 | 10,022,000.00 |
| 17 | පොළොන්නරුව | 316 | 71 | 387 | 13 | 3 | 16 | 291 | 132 | 423 | 1840 | 812 | 2652 | **3478** | 2460 | 2131 | 1018 | 2,000.00 | 4,920,000.00 |
| 18 | බදුල්ල | 102 | 506 | 608 | 34 | 9 | 43 | 669 | 186 | 855 | 2712 | 1126 | 3838 | **5344** | 3921 | 3381 | 1827 | 2,000.00 | 7,842,000.00 |
| 19 | මොණරාගල | 274 | 64 | 338 | 15 | 8 | 23 | 432 | 155 | 587 | 1844 | 928 | 2772 | **3720** | 2565 | 2276 | 1155 | 2,000.00 | 5,130,000.00 |
| 20 | රත්නපුරය | 678 | 142 | 820 | 32 | 6 | 38 | 1019 | 378 | 1397 | 3937 | 1750 | 5687 | **7942** | 5666 | 4956 | 2276 | 2,000.00 | 11,332,000.00 |
| 21 | කෑගල්ල | 659 | 137 | 796 | 19 | 5 | 24 | 839 | 229 | 1068 | 3799 | 1330 | 5129 | **7017** | 5316 | 4638 | 1701 | 2,000.00 | 10,632,000.00 |
| | **එකතුව** | **11354** | **2777** | **14131** | **438** | **79** | **517** | **17136** | **5368** | **22504** | **64141** | **24747** | **88888** | **126039** | **93473** | **81277** | **32971** | | **186,946,000.00** |

වගුව 03.2 - දහම් පාසල් ගුරු සංඛ්‍යා විස්තර සමස්ත වාර්තාව - 2015

| | දිස්ත්‍රික්කය | දහම් පාසල් ගණන | ශ්‍රේණි අනුව ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 11 | 12 | |
| 1 | කොළඹ | 669 | 18655 | 21986 | 23040 | 22497 | 21936 | 21476 | 21062 | 19712 | 18860 | 16560 | 14033 | 4699 | 224516 |
| 2 | ගම්පහ | 747 | 18779 | 23031 | 24163 | 23717 | 21947 | 22579 | 22105 | 21045 | 19864 | 17487 | 13622 | 4591 | 232930 |
| 3 | කළුතර | 574 | 12286 | 15215 | 16093 | 15813 | 14513 | 14788 | 14576 | 13882 | 13003 | 10792 | 8283 | 2504 | 151748 |
| 4 | මහනුවර | 840 | 13000 | 16213 | 16895 | 16728 | 15588 | 16007 | 16042 | 15539 | 14244 | 12624 | 9519 | 4005 | 166404 |
| 5 | මාතලේ | 366 | 4961 | 5744 | 6076 | 5745 | 5432 | 5582 | 5551 | 5279 | 4965 | 4340 | 3192 | 1324 | 58191 |
| 6 | නුවරඑළිය | 266 | 3322 | 4090 | 4307 | 4382 | 4130 | 4134 | 4234 | 3927 | 3646 | 3210 | 2332 | 1035 | 42749 |
| 7 | ගාල්ල | 662 | 11764 | 14971 | 15666 | 15631 | 14364 | 14647 | 13986 | 13206 | 12126 | 9877 | 6965 | 2746 | 145949 |
| 8 | මාතර | 523 | 8893 | 11790 | 12514 | 12330 | 11257 | 11257 | 11286 | 10851 | 10180 | 8546 | 6301 | 2372 | 117577 |
| 9 | හම්බන්තොට | 432 | 7487 | 8931 | 9341 | 9303 | 8271 | 8841 | 8587 | 8096 | 7587 | 6607 | 4454 | 2283 | 89788 |
| 10 | වව්නියාව | 19 | 233 | 306 | 282 | 262 | 273 | 271 | 256 | 252 | 263 | 253 | 205 | 105 | 2961 |
| 11 | මුලතිව් | 11 | 212 | 192 | 172 | 187 | 170 | 132 | 166 | 143 | 112 | 122 | 91 | 36 | 1735 |
| 12 | අම්පාර | 185 | 3380 | 3710 | 4021 | 3999 | 3486 | 3781 | 3877 | 3756 | 3516 | 2922 | 2100 | 893 | 39441 |
| 13 | ත්‍රිකුණාමලය | 89 | 1591 | 1707 | 1809 | 1823 | 1682 | 1567 | 1529 | 1540 | 1480 | 1396 | 893 | 366 | 17383 |
| 14 | කුරුණෑගල | 1199 | 15920 | 20025 | 21543 | 20890 | 18398 | 19830 | 19813 | 18864 | 17624 | 14817 | 10265 | 4097 | 202086 |
| 15 | පුත්තලම | 284 | 4678 | 5164 | 5385 | 5061 | 4929 | 4854 | 4740 | 4434 | 4224 | 3785 | 2799 | 929 | 50982 |
| 16 | අනුරාධපුරය | 681 | 10861 | 12235 | 12717 | 12299 | 11236 | 11687 | 11664 | 11444 | 10301 | 9136 | 6696 | 3115 | 123391 |
| 17 | පොළොන්නරුව | 291 | 5314 | 6035 | 5997 | 6048 | 5754 | 5860 | 5698 | 5504 | 5133 | 4357 | 3386 | 1027 | 60113 |
| 18 | බදුල්ල | 474 | 6794 | 8443 | 9108 | 9221 | 8476 | 9265 | 9087 | 8526 | 8015 | 6818 | 5649 | 2204 | 91606 |
| 19 | මොණරාගල | 306 | 4792 | 6110 | 6752 | 6446 | 5668 | 6185 | 5911 | 5548 | 5135 | 4279 | 3084 | 1143 | 61053 |
| 20 | රත්නපුරය | 652 | 9312 | 12455 | 13405 | 12883 | 11211 | 12463 | 13047 | 14266 | 11108 | 9184 | 7217 | 2791 | 129342 |
| 21 | කෑගල්ල | 587 | 7546 | 9803 | 10817 | 10554 | 9890 | 10091 | 10061 | 9636 | 8961 | 7897 | 5808 | 2445 | 103509 |
| | එකතුව | 9857 | 169780 | 208156 | 220103 | 215819 | 198611 | 205297 | 203278 | 195450 | 180347 | 155009 | 116894 | 44710 | 2113454 |


වගුව 03.3 - දහම් පාසල් ගුරු සංඛ්‍යා විස්තර සමස්ත වාර්තාව - 2015






- **2015 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 10,720 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2,113,454කි.**

2015 වර්ෂයේ දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීමේ ආකෘති පත් 60,000 ක් මුද්‍රණය කර ඇති අතර වියදම් වූ මුදල රුපියල් 154,560.00 කි.




ප්‍රස්තාරය 03.4 - 2015 - දහම් පාසල් සංඛ්‍යාව

## 03.3. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම

දහම් පාසලෙහි ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම විභාගය පැවැත්වේ. 2015 වර්ෂයේ දී විභාග මධ්‍යස්ථාන 3,914 ක දී අයදුම්කරුවන් 953,416 දෙනෙක් සඳහා ශ්‍රේණි විභාගය පවත්වන ලද අතර මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් 21,000,000 ක් වූ අතර දරන ලද වියදම රුපියල් 17,510,072 කි.

## 03.4. 120 වන දහම් පාසල් දිනය සැමරීම.


සමස්ත ලංකා දහම් පාසල් දිනය සැමරීමේ උත්සවය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසල ආරම්භ කළ දිනය වන 1895 අගෝස්තු මස 03 වන දින බැවින් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දිනයි. 2015 වර්ෂයට යෙදුණු 120 වැනි දහම් පාසල් දින සැමරුම් උත්සවය අගෝස්තු 03 දින බණ්ඩාරවෙල නගර සභා ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.



එහි දී සිසු සවිය ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ දහම් පාසල් වල 10 ශ්‍රේණියෙන් වැඩිම ලකුණු ලබා ගත් සිසුන් සඳහා අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය අවසන් කරන තෙක් රු. 500 බැගින් වර්ෂ දෙකක් සඳහා ශිෂ්‍යත්ව ලබා දෙන ලදි. මෙම ශිෂ්‍යත්ව සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදලින් දෙනු ලැබේ.

දහම් පාසල්හි ඉගැන්වීමේ කටයුතු සඳහා ගුරු භවතුන් දිරි ගැන්වීමට හා උනන්දු කරවීමට පිටුවහලක් ලබා දීම අරමුණු කර ගෙන වසර 30 ක ට වැඩි සේවා කාලයක් ඇති දහම් පාසල් ගුරු භවතුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම හා වසර 50ක් සම්පූර්ණ වූ සේවා කාලයක් ඇති දහම් පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 1,000 බැගින් වෛද්‍යාධාර ලබා දීමේ වැඩසටහන ද ක්‍රියාත්මක කරන ලදි. ඉහත වැඩසටහන සඳහා වැය වූ මුදල රු. 580,000.00 කි.

## 03.5. ගුරු භවතුන් සඳහා පුස්තකාල දීමනා, නිල ඇඳුම් සහ මාසික දීමනා ලබා දීම.




ප්‍රස්තාරය 03.5 - 2015 - දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව

2015 වර්ෂයේ දී මෙම පුස්තකාල දීමනා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 317 ක දහම් පාසල් 9,857 ක් සඳහා ලබා දෙන ලදි.

එම දීමනා ලැබීමට සුදුසුකම් ලැබූ මුළු සංඛ්‍යාව 93,473 ක් වේ. එක් ගුරු භවතෙකු සඳහා රුපියල් 2,000.00 ක වාර්ෂික පුස්තකාල දීමනාවක් ගෙවනු ලැබේ. ඒ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 170,000,000 වන අතර වියදම රු. 152,624,785 ක් වේ.

2015 වසරේ සමස්ත ගුරුවරුන් සඳහා මසකට රුපියල් 200.00 ක දීමනාවක් දහම් පාසල් 9,857 ක් සඳහා ලබා දෙන ලදි. බස්නාහිර පළාතේ ගුරු භවතුන් සඳහා මසකට රුපියල් 200.00 බැගින් මාස 06 ක ට ද, අනෙකුත් පළාත් සඳහා මාස 07 ක ට, (යාපනය, කිලිනොච්චිය, මන්නාරම යන දිස්ත්‍රික්ක හැර) දහම් පාසල් ගුරුවරුන් 126,039 දෙනෙකුට ඉහත දීමනාව දෙන ලදි.

නිස්සරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් 2004 වසරේ සිට දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුට ම නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.

දහම් පාසල් ගුරු ශිෂ්‍ය ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දහම් පාසල් වෙත ලබා දීම.

↓

එම ගුරු ශිෂ්‍ය ලේඛන සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දහම් පාසල් වෙතින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා ගැනීම.

↓

සම්පූර්ණ කරන ලද ගුරු ශිෂ්‍ය ලේඛන පරීක්ෂා කර නිවැරදි නම් ඒ අනුව සම්පිණ්ඩන වාර්තා සකස් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා ගැනීම

↓

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දී නැවත වරක් පරීක්ෂා කර ඒවා ප්‍රධාන කාර්යාලය වෙත ගෙනැවිත් භාර දීම.

↓

එම සම්පිණ්ඩන වාර්තා හා ගුරු ශිෂ්‍ය ලේඛන පදනම් කරගෙන සමස්ත වාර්තා සකස් කිරීම.

↓

එම තොරතුරු අනුව පිරිමි හා කාන්තා ගුරුවරු ප්‍රමාණයට වෙන වෙනම නිල ඇඳුම් ඇණවුම් කිරීම.

↓

ඇණවුම් කරන ලද නිල ඇඳුම් ලබා ගැනීම හා ගබඩා කිරීම.

↓

ලේඛනගත තොරතුරු පදනම් කරගෙන සුදුසුකම් ලත් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගරු ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත ගෙනගොස් භාර දීම.

↓

නිල ඇඳුම් අදාල ගුරුභවතා වෙත ලද බවට අත්සන් ලේඛන ගෙන්වා ගැනීම

↓

නිල ඇඳුම් නිකුත් කරන ආකාරය තොග පොතේ සටහන් කිරීම.

සටහන 03.1 - දහම් පාසල් ගුරු භවතුන්ට නිල ඇඳුම් ලබා දීමේ ක්‍රමවේදය

නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ මහත් සොම්නසකිනි. නිල ඇඳුම් ප්‍රදානයත් සමඟ දහම් පාසල් ගුරුවරුන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වී තිබෙන බව ද දැකිය හැකිය. ඒ සමඟම දහම් පාසල් සිසු දරු දැරියන්ගේ ද වර්ධනයක් ඇති වී තිබේ. ඒ අනුව සදාචාරවත් සමාජයක් ගොඩනැඟීම සඳහා මෙලෙස දහම් පාසල් ගුරුවරුන් හට නිල ඇඳුම් ප්‍රදානය කිරීම මහෝපකාරී වේ. රජය මේ සඳහා සෑම වසරක දී ම රුපියල් මිලියන

සියයකට අධික මුදලක් වැය කරනු ලබයි. ඒ අනුව මෙවර ද රුපියල් මිලියන 150ක් පමණ ඒ වෙනුවෙන් වැය කර ඇත.


<u>නිල ඇඳුම් ලබා දීමේ වියදම් ස්වභාවය -</u>

- කාන්තා නිල ඇඳුමක් සඳහා වියදම = රු. 1,400.00
- පිරිමි නිල ඇඳුමක් සඳහා වියදම = රු. 940.00
- ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල මට්ටමින් ප්‍රවාහනය සඳහා වැය වූ මුළු වියදම = රු. 1,000,000.00

## 03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය

මෙම විභාගය පැවැත්වීමෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

1. දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම.
2. දහම් පාසල්හි ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරු භවතුන්ගේ සේවය අගය කිරීම.
3. ගුරු භවතුන්ගේ දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම.
4. දහම් පාසල් ගුරු භවතුන් සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම හා එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම




ප්‍රස්තාරය 03.6 - දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාග ප්‍රතිඵල - 2015

2015 වර්ෂයේ දිස්ත්‍රික්ක 20 ක අපේක්ෂකයන් සඳහා විභාග මධ්‍යස්ථාන 21 ක දී මෙම විභාගය පවත්වන ලදි. ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 8,659 කි. ඒ අතරින් 7,676 දෙනෙක් විභාගය සඳහා සුදුසුකම් සපුරන ලද අතර ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව 5,433 කි. ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 2,243 වන අතර එය විභාගය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 29.22% ක ප්‍රතිශතයකි.

2015 මැයි මස 23 දින පැවැත්වූ මෙම විභාගය සඳහා රුපියල්1,035,536.00 ක මුදලක් වැය වී ඇත. 2015 අගෝස්තු මස 11 දිනය වන විට ප්‍රතිඵල නිකුත් කිරීම සිදු විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගණන | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 1 | 638 | 546 | 356 | 78 | 197 | 73 | 8 | 190 |
| 2 | ගම්පහ | 1 | 486 | 448 | 338 | 21 | 145 | 157 | 15 | 110 |
| 3 | කළුතර | 1 | 519 | 466 | 305 | 36 | 171 | 79 | 19 | 161 |
| 4 | මහනුවර | 2 | 731 | 648 | 441 | 9 | 110 | 193 | 129 | 207 |
| 5 | මාතලේ | 1 | 337 | 308 | 241 | 20 | 70 | 120 | 31 | 67 |
| 6 | නුවරඑළිය | 1 | 273 | 237 | 162 | 15 | 32 | 75 | 40 | 75 |
| 7 | ගාල්ල | 1 | 691 | 620 | 439 | 46 | 211 | 168 | 14 | 181 |
| 8 | මාතර | 1 | 406 | 372 | 264 | 42 | 127 | 85 | 10 | 108 |
| 9 | හම්බන්තොට | 2 | 377 | 338 | 245 | 98 | 113 | 34 | 50 | 93 |
| 10 | අම්පාර | 1 | 404 | 352 | 240 | 27 | 127 | 75 | 11 | 112 |
| 11 | කුරුණෑගල | 1 | 966 | 860 | 71 | 75 | 302 | 202 | 33 | 248 |
| 12 | ත්‍රිකුණාමලය | 1 | 121 | 101 | 612 | 22 | 44 | 2 | 3 | 30 |
| 13 | පුත්තලම | 1 | 327 | 299 | 202 | 26 | 88 | 69 | 19 | 97 |
| 14 | අනුරාධපුරය/වව්නියාව | 1 | 536 | 467 | 341 | 21 | 128 | 160 | 32 | 126 |
| 15 | පොළොන්නරුව | 1 | 472 | 397 | 277 | 21 | 124 | 101 | 31 | 120 |
| 16 | බදුල්ල | 1 | 379 | 338 | 256 | 42 | 161 | 43 | 10 | 82 |
| 17 | මොණරාගල | 1 | 13 | 13 | 8 | 0 | 2 | 3 | 3 | 5 |
| 18 | රත්නපුරය | 1 | 603 | 538 | 394 | 15 | 174 | 174 | 31 | 144 |
| 19 | කෑගල්ල | 1 | 380 | 328 | 241 | 49 | 120 | 58 | 14 | 87 |
| | එකතුව | 21 | 8659 | 7676 | 5433 | 663 | 2446 | 1871 | 503 | 2243 |

වගුව 03.4 - දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය ප්‍රතිඵල සමස්ත සාරාංශය

## 03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම

දහම් පාසල් සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම උදෙසාත්, නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් සිසු නිපුණතා ඇගයීමේ වැඩසටහන මෙම වර්ෂයේ ද අති සාර්ථකව පවත්වනු ලැබිය.

මෙම සිසු නිපුණතා ඇගයීම පවත්වන්නේ දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් අදියර හතරකිනි. 2015 වර්ෂයේ නව තරඟ ඉසව්වක් හඳුන්වා දෙමින් "මව් පිය ගුණ ගී ගායනා" නිපුණතාව පැවැත්විණි. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් තුමන්ගේ සංකල්පයකට අනුව ආරම්භ වූ මෙම තරඟ ඉසව්ව වැඩසටහනේ අති සාර්ථක ම සහ ජනප්‍රියතම අංගය බවට පත් විය.



මෙවර වැඩසටහන පැවැත්වූයේ අම්පාර ඩී.එස්. සේනානායක ජාතික පාසලේ දී වන අතර ප්‍රධාන ආරාධිතයා වශයෙන් ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු විය.

ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 10,000.00 බැගින් ද, දිස්ත්‍රික් සංවිධාන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 18,000.00 බැගින් ද ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත මුදල රු. 16,536,000 වන අතර රු. 16,252,785 ක් 2015 වර්ෂය වෙනුවෙන් වැය විය.

## 03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

වර්ෂයට අවශ්‍ය පෙළ පොත් ප්‍රමාණය දහම් පාසල් මඟින් දැනුම් දීමෙන් අනතුරුව පොත් මුද්‍රණය සිදු කරනු ඇත. මෙම පොත් මුද්‍රණය කිරීම රජයේ මුද්‍රණාලයෙන්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් හා ප්‍රින්ටස් එක්සලට් පුද්ගලික ආයතනයෙන් සිදු කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. 80,000,000.00 ක් ද, වැය වූ සම්පූර්ණ වියදම රු. 79,799,619 කි.

එම පොත් මුද්‍රණය කරවා 2015 වර්ෂයට සියළුම දහම් පාසල් වලට බෙදා දිය හැකි පරිදි දෙපාර්තමේන්තුවේ ගබඩාවට භාර දීමෙන් පසු දිවයින පුරා පිහිටි ලියාපදිංචි දහම් පාසල් වලට බෙදා හැරීම සිදු කරන ලදි.

දහම් පාසල් 8 ශ්‍රේණිය පෙළ පොත මෙම වසරේ දී ප්‍රතිනිර්මාණය කරන ලදි.

| | |
|---|---|
| මුළු දිස්ත්‍රික්ක ගණන | = 21 |
| ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගණන | = 319 |
| දහම් පාසල් ගණන | = 9,846 |
| බෙදා හරින ලද මුළු පොත් ගණන | = 1,973,239 |

වගුව 03.5 - දහම් පාසල් පෙළ පොත් බෙදීම 2015 - සාරාංශය



## 03.9. බුද්ධ ජයන්ති පොත් හල

මහජනතාවගේ අවශ්‍යතාව සඳහා දහම් පොත් අලෙවි කිරීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත් හල මඟින් සිදු කරනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ විශ්වකෝෂ ඇතුළු පොත් වර්ග හැට හතරක් (64) මෙහි අලෙවිය සඳහා තිබේ.

2015 වසරේ පොත් අටසිය හැට හතරක් (864) පමණ අලෙවි කර ඇති අතර රුපියල් 736,127.00 ක මුදලක් ලැබී ඇත. එම මුදල් ඒ ඒ දිනවල ප්‍රධාන කාර්‍යාලය වෙත භාර දෙන ලදි.

<u>පොත් හල පිළිබඳ ප්‍රසිද්ධියක් ලබා දීම සඳහා සිදු කර ඇති ක්‍රියාකාරකම්.</u>

- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල දැනුවත් කර ඇත.
- පුවත්පත් හා අන්තර්ජාලය මඟින් දැන්වීම් සහ තොරතුරු පල කිරීමට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය වෙත තොරතුරු ලබා දී ඇත.
- පොත් හල ඉදිරිපිට බැනරයක් සවි කර ඇත.
- අකාරාදී පිළිවෙළට සැකසූ ග්‍රන්ථ නාම ලේඛනයක් පොත් හල ඉදිරිපිට ප්‍රසිද්ධ කර ඇත.

පොත් හල පවත්වා ගෙන යන කාමරයට වේයන්ගෙන් උවදුරු ඇතිවූ බැවින් කෘමි උවදුරු සඳහා බෙහෙත් යොදන ලදි. පොත් තැබීම සඳහා දෙපාර්තමේන්තුව සතු යකඩ රාක්කයක් පිළිසකර කොට පොත් හල වෙත ලබා ගන්නා ලදි.

# 04

# සංවර්ධන අංශය

දැහැමි සමාජයක් බිහි කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම පෙරදැරිව විහාරස්ථාන වල පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් දුෂ්කර ප්‍රදේශ වල පවතින විහාරස්ථාන වල ඉදිකිරීම් කටයුතු හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විහාර ආධාර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.


## 04.1. දුෂ්කර විහාරස්ථාන සඳහා ආධාර ලබා දීම.

මේ යටතේ 2015 වර්ෂයේ දිවයිනේ දිස්ත්‍රික්ක 20 ක විහාරස්ථාන සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදලින් දිවයින පුරා පවතින පොදු පහසුකම් රහිත විහාරස්ථාන වල භෞතික සම්පත් වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත. මෙහි විශේෂිත අරමුණ වන්නේ විනාශ වෙමින් හා අබලන්ව පවතින විහාරස්ථාන යළි ප්‍රතිසංස්කරණය කර බෞද්ධ ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනය නඟා සිටුවීමට අවස්ථාව සලසා දීමයි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථාන ගණන | ලබා දී ඇති ආධාර මුදල | අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථාන ගණන | ලබා දී ඇති ආධාර මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 21 | 1,050,000.00 | 13 | ගාල්ල | 4 | 200,000.00 |
| 2 | ගම්පහ | 46 | 2,450,000.00 | 14 | අම්පාර | 10 | 1,000,000.00 |
| 3 | කළුතර | 22 | 1,100,000.00 | 15 | මාතලේ | 3 | 150,000.00 |
| 4 | මහනුවර | 33 | 1,650,000.00 | 16 | මොණරාගල | 21 | 2,100,000.00 |
| 5 | කුරුණෑගල | 53 | 2,750,000.00 | 17 | අනුරාධපුරය | 28 | 2,900,000.00 |
| 6 | කෑගල්ල | 29 | 1,500,000.00 | 18 | ත්‍රිකුණාමලය | 19 | 1,900,000.00 |
| 7 | හම්බන්තොට | 4 | 400,000.00 | 19 | මඩකලපුව | 3 | 400,000.00 |
| 8 | පුත්තලම | 12 | 1,200,000.00 | 20 | මන්නාරම | 5 | 500,000.00 |
| 9 | මාතර | 4 | 200,000.00 | 21 | වව්නියාව | 1 | 100,000.00 |
| 10 | නුවරඑළිය | 21 | 2,100,000.00 | 22 | මුලතිව් | 5 | 500,000.00 |
| 11 | බදුල්ල | 347 | 18,550,000.00 | 23 | යාපනය | 5 | 500,000.00 |
| 12 | පොළොන්නරුව | 17 | 1,700,000.00 | 24 | කිලිනොච්චිය | 1 | 100,000.00 |
| **එකතුව = රු. 45,000,000.00** | | | | | | | |

වගුව 04.1 - දුෂ්කර විහාරස්ථාන ආධාර - 2015


මෙම වැඩසටහන යටතේ විහාරස්ථාන 714 ක් වැඩිදියුණු කිරීම සඳහා ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.45,000,000.00 ප්‍රමාණයකින් රු.43,917,107.00 ක මුදලක් වැය කර ඇත.



## 04.2. සිල්මාතා ආරාම වැඩි දියුණු කිරීම.

2015 වර්ෂය තුළ දී සිල්මාතා අධ්‍යාපන ආයතන ක්‍රියාත්මක කිරීම යටතේ කැලණිය සිල්මාතා මූලස්ථානය ඉදිකිරීමේ කටයුතු සඳහා රු. 7,000,000.00 ක ප්‍රතිපාදන වෙන් වූ අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. එමෙන්ම දැව භාණ්ඩ මිලදී ගැනීම් සිදු කර අවසන් කර ඇත. මේ සඳහා රු.6,978,111.00 ක වියදමක් දරා ඇත.

තවද මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා අභ්‍යාස ආයතනයේ පරිපාලන වියදම් සහ ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 4,000,000.00 ක ප්‍රමාණයෙන් රු. 3,399,249.00 ක ප්‍රමාණයක් වැය කර ඇත. එම ආයතනය මඟින් කෙටි කාලීන හා දිගු කාලීන පාඨමාලා සාර්ථකව පවත්වා ගෙන යාම සිදු කරයි. මෙමඟින් දිවයින පුරා විසිරී සිටින සිල්මාතාවන්ට සිය ආගමික කටයුතු ප්‍රවර්ධනය කර ගැනීමටත් ආධ්‍යාත්මික ගුණ වගාවන් හා අධ්‍යාපනික දැනුම වර්ධනය කර ගැනීමටත් හැකි වීම 2015 වර්ෂය තුළ ලද සුවිශේෂී ප්‍රගතියක් ලෙස පෙන්වා දිය හැකිය.




ප්‍රස්තාරය 04.1 – 2015.12.31 දිනට ලංකාවේ ලියාපදිංචි සිල් මැණිවරු සංඛ්‍යාව

## 04.3. උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීම.

2015 දී උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීමට රු. 2,750,000.00 ක ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර විවිධ නිකායන්හි ස්වාමීන් වහන්සේලා 713 දෙනෙකු සඳහා උපසම්පදා උත්සවයන්හි ගමන් වියදම් හා පිරිකර වෙනුවෙන් රු. 2,141,151.00 ක වියදමක් දරණ ලදි. මෙලෙස උපසම්පදා උත්සව සඳහා ආධාර කිරීම හේතුවෙන් ශාසනයේ පැවැත්ම හා භික්ෂූන් වහන්සේලාගේ ආගමික නැඹුරුව තව තවත් වර්ධනයට ඉවහල් වේ.



## 04.4. සිවිපස ආධාර ලබා දීම.

2015 වසර තුළ මේ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 1,615,890.00 ක් වූ අතර එම සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය ම වැය කරමින් සිවිපස ආධාර ලෙස ලබා දීමට කටයුතු කර ඇත. මෙය සිවිපසය නොලැබෙන දුෂ්කර ප්‍රදේශවල වෙසෙන භික්ෂූන් වහන්සේලාට තම අධ්‍යාපනික හා ආගමික කටයුතු කරගෙන යාමට මහත් පිටුවහලක් වූ අතර ශාසනයේ පැවැත්ම සඳහා ද ඉවහල් විය.

## 04.5. බෞද්ධ ලේඛකයින් දිරි ගැන්වීම.

බෞද්ධ ජනතාව වෙත දහම් දැනුම බෙදා දෙන ලේඛකයන් දිරි ගැන්වීම මඟින් බෞද්ධ සාරධර්ම වර්ධනය කිරීමට අවශ්‍ය පොත් පත් නිර්මාණය කර ගැනීමට හැකි වන අතර එම අරමුණ වෙනුවෙන් 2015 වසරේ දී රු. 250,000.00 ක ප්‍රතිපාදන වෙන්ව තිබුණි. කතුවරයන් 17 දෙනෙකුගෙන් ලබා ගත් පොත් ප්‍රමාණය 916 ක් වේ. ඒ සඳහා රුපියල් 163,836.00 ක මුදලක් වැය කරන ලදි.

## 04.6. දහම් පාසල් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම.

| දිස්ත්‍රික්කය | ගොඩනැඟිලි | මුදල | උපකරණ | මුදල | එකතුව |
|---|---|---|---|---|---|
| කොළඹ | 10 | 1,000,000.00 | 0 | - | 1,000,000.00 |
| මහනුවර | 0 | | 17 | 850,000.00 | 850,000.00 |
| නුවරඑළිය | 4 | 400,000.00 | 0 | - | 400,000.00 |
| කෑගල්ල | 4 | 400,000.00 | 0 | - | 400,000.00 |
| අනුරාධපුරය | 26 | 2,600,000.00 | 23 | 1,150,000.00 | 3,750,000.00 |
| පොළොන්නරුව | 13 | 1,300,000.00 | 6 | 300,000.00 | 1,600,000.00 |
| කුරුණෑගල | 6 | 600,000.00 | 5 | 250,000.00 | 850,000.00 |
| පුත්තලම | 0 | - | 15 | 750,000.00 | 750,000.00 |
| බදුල්ල | 4 | 400,000.00 | 16 | 800,000.00 | 1,200,000.00 |
| මොණරාගල | 17 | 1,700,000.00 | 8 | 400,000.00 | 2,100,000.00 |
| ත්‍රිකුණාමලය | 5 | 500,000.00 | 1 | 50,000.00 | 550,000.00 |
| මුලතිව් | 0 | - | 7 | 350,000.00 | 350,000.00 |
| අම්පාර | 1 | 100,000.00 | 0 | - | 100,000.00 |
| ගම්පහ | 1 | 100,000.00 | 0 | - | 100,000.00 |
| එකතුව | 91 | 9,100,000.00 | 98 | 4900000 | 14,000,000.00 |

වගුව 04. 2 – 2015 වර්ෂයේ දී ලබා දුන් දහම් පාසල් ආධාර

මේ යටතේ 2015 වර්ෂය තුළ දහම් පාසල් ගොඩනැඟිලි ඉදි කිරීම සහ දහම් පාසල් උපකරණ ආධාර සැපයීම සඳහා රු. 14,000,000.00 ක ප්‍රතිපාදන වෙන් ව තිබුණි. ඉන් අදාළ සංවර්ධන කටයුතු සහ උපකරණ ආධාර සැපයීම පිණිස වැය වූ මුදල රු. 13,308,183.00 කි.




මෙමඟින් දහම් පාසල් වල පවතින භෞතික සම්පත් වැඩිදියුණු කිරීමට හැකි වූ අතර දහම් පාසල් සිසුන් තවදුරටත් දහම් පාසල් වෙත නැඹුරු කර ගැනීමට හැකි විය.

## 04.7. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම.

මෙහිදී 2015 වසරේ දිස්ත්‍රික්ක 12 ක ලියාපදිංචි කාර්ය සාධන සමිති සංඛ්‍යාව 30 කි.

| දිස්ත්‍රික්කය | අනුරාධපුර | කළුතර | කෑගල්ල | කුරුණෑගල | කොළඹ | ගම්පහ | ගාල්ල | පොළොන්නරුව | මහනුවර | මාතර | මාතලේ | හම්බන්තොට |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමිති ගණන | 01 | 01 | 04 | 05 | 03 | 03 | 03 | 03 | 02 | 03 | 01 | 01 |

වගුව 04.3 – 2015 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද විහාරස්ථ කාර්ය සාධක සමිති ගණන

2015 වසරේදී ලියාපදිංචි කරන ලද විහාරස්ථාන කාර්ය සාධක සමිති ගණන 30කි. දායක සභා 3089 ක් ද ලියාපදිංචි කර ඇත.

| දිස්ත්‍රික්කය | අනුරාධපුර | කළුතර | කෑගල්ල | කුරුණෑගල | කොළඹ | ගම්පහ | ගාල්ල | පොළොන්නරුව | මහනුවර | මාතර | මාතලේ | හම්බන්තොට | පුත්තලම | මඩකලපුව | නුවරඑළිය | මොණරාගල | බදුල්ල | රත්නපුර | ත්‍රිකුණාමලය | අම්පාර | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දායක සභා ගණන | 173. | 144 | 176 | 492 | 93 | 179 | 200 | 72 | 271 | 194 | 85 | 164 | 108 | 4 | 93 | 74 | 325 | 188 | 16 | 22 | 16 |

වගුව 04.4 – 2015 වර්ෂය වන විට ලියාපදිංචි කරන ලද දායක සභා ගණන

## 04.8. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරීම.

**04.8.1. උපකරණ වෙනුවෙන් වියදම් දැරීම**.

ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය යටතේ විහාරස්ථාන වල අඩුපාඩුව පවතින මේස, බංකු මෙන්ම පරිගණක ආදී අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දීම මෙම වැඩසටහන යටතේ සිදු කරන අතර, 2015 දී වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 4,000,000.00 ප්‍රමාණය සම්පූර්ණයෙන් ම වැය කරන ලදි. මෙමඟින් ශාසනාරක්ෂක මණ්ඩල වල අඩුපාඩුකම් සපුරාලීමට හැකි විය.




**04.8.2. ශාසනාරක්ෂක මණ්ඩල වියදම් දැරීම.**

මේ යටතේ ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීම, එම උත්සව සංවිධානය කිරීම හා එම රැස්වීම් වලට සහභාගී වන ස්වාමීන් වහන්සේලාගේ ගමන් වියදම්, සිව්පස

සැපයුම් වෙනුවෙන් වියදම් දරනු ලබයි. 2015 වසරේ දී මේ සඳහා රු. 7,000,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්ව තිබූ අතර රු. 6,898,919.00 ක වියදමක් දරන ලදි.

- ලිපිද්‍රව්‍ය, ගමන් වියදම් සහ තැපැල් ගාස්තු සඳහා ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ වෙත එක් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලකට ලබා දෙන මුදල = රු. 15,000.00
- ලිපිද්‍රව්‍ය, ගමන් වියදම් සහ තැපැල් ගාස්තු සඳහා ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ වෙත එක් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලකට ලබා දෙන මුදල = රු. 7,500.00

## 04.9. ජාතික උත්සව සංවිධානය කිරීම.

### 04.9.1. ජාතික නිදහස් දින පිරිත් සජ්ඣායනාව හා දානමය පිංකම

මෙම වැඩසටහන ජාතික නිදහස් දිනය සැමරීම අරමුණු කොට වාර්ෂිකව පැවැත්වෙන නිදහස් දින උළෙලට සමගාමීව පැවැත්වෙන ආගමික කටයුත්තකි. කොළඹ නිදහස් මන්දිරයේ දී සෑම වසරකම නිදහස් දිනට පෙර දිනකදී මහා පිරිත් සජ්ඣායනාවක් පවත්වා පසු දින සංඝගත දක්ෂිණාවක් පවත්වනු ලබයි.

2015 වර්ෂයේ දී මේ සඳහා රු. 976,855.48 ක වියදමක් දරන ලදි. මෙමඟින් ජාතික නිදහස් දිනය සැමරීම මෙන්ම එහි ආගමික වැඩසටහන් මඟින් මහ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය වැඩි දියුණු කිරීමට හේතු විය.

### 04.9.2. ජාතික වෙසක් උත්සවය

සෑම වසරකම වෙසක් දිනය වෙනුවෙන් ජාතික වෙසක් උත්සව වැඩසටහනක් මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. මෙමඟින් ජාතික වශයෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ එක් ප්‍රදේශයක් මූල කොට ගෙන එහි විහාරස්ථාන වල ප්‍රතිසංස්කරණ කටයුතු හා ආධාර ලබා දීම මෙන්ම පාසල් හා දහම් පාසල් සිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය වැඩි දියුණු වීමද සිදු වේ.

මෙම වැඩසටහන යටතේ 2015 වසරේ දී බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගණය රජමහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් මෙම ජාතික වෙසක් උත්සවය පවත්වන ලදි. මේ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 215,455.80 ක් වන අතර රු. 215,755.80 ක මුදලක් වැය වී ඇත.

### 04.9.3. සංඝමිත්තා ගුණ සමරු උළෙල

2323 වන සංඝමිත්තා ගුණ සමරු උත්සවය 2015 දෙසැම්බර් මස 06 සහ 07 දෙදින අනුරාධපුරයේ දී පවත්වන ලදි. සංඝමිත්තා පෙරහැර දෙසැම්බර් මස 06 වන දින පැවති අතර මෙම පෙරහැර අනුරාධපුර විහාර මහා දේවී ආරාමය කේන්ද්‍ර කර ගනිමින්

දිවයිනේ දිස්ත්‍රික්ක 16 ක් නියෝජනය කරන සිල් මෑණියන් වහන්සේලා 800 නමකගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

වාර්ෂිකව පවත්වනු ලබන සමස්ත ලංකා සිල් මාතා ජාතික සම්මේලනය දෙසැම්බර් මස 07 වන දින අනුරාධපුර මහා විහාරස්ථ සන්නිපාත ශාලාවේ දී පවත්වන ලදි. එම අවස්ථාවට බුද්ධ ශාසන අමාත්‍යතුමා, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු සම්භාවනීය පිරිසක් සහභාගී විය.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. | අනු අංකය | දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | 172,000 | 10 | මහනුවර | 316,000 |
| 02 | ගම්පහ | 632,000 | 11 | අම්පාර | 228,000 |
| 03 | කළුතර | 430,000 | 12 | කුරුණෑගල | 56,000 |
| 04 | ගාල්ල | 308,000 | 13 | පුත්තලම | 256,000 |
| 05 | මාතර | 258,000 | 14 | අනුරාධපුරය | 168,000 |
| 06 | හම්බන්තොට | 174,000 | 15 | පොළොන්නරුව | 220,000 |
| 07 | මාතලේ | 148,000 | 16 | බදුල්ල | 108,000 |
| 08 | නුවරඑළිය | 100,000 | 17 | මොණරාගල | 1,208,000 |
| 09 | කෑගල්ල | 60,000 | 18 | රත්නපුර | 208,000 |

වගුව 04.5 - ශාසනාරක්ෂක කටයුතු වෙනුවෙන් පරිගණක ඇතුළු කාර්යාලයීය උපකරණ ලබා දීම සඳහා ප්‍රතිපාදන සැපයීම

## 04.10. ආදාහන සඳහා වියදම් දැරීම.

මෙම වැඩසටහන යටතේ අපවත් වන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ ආදාහන පූජෝත්සව සඳහා ආධාර මුදලක් ලබා දෙන ලද අතර 2015 වසරේදී මේ වෙනුවෙන් වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 1,750,000.00 ක මුදලින් රු. 1,721,000.00 ක මුදලක් වැය කරන ලදි.

# 05

# ව්‍යාපෘති අංශය

## 05.1. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන

දහම් පාසල් ප්‍රධානාචාර්ය වරුන්ගේ කාර්යභාරය වඩාත් විශිෂ්ටත්වයට, ප්‍රවීණත්වයට පත් කිරීම සඳහා 2015 වර්ෂයේදී ප්‍රධානාචාර්ය හා උප ප්‍රධානාචාර්ය වැඩසටහන පවත්වන ලදි. එමඟින් දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

2015 වර්ෂයේ දිස්ත්‍රික්ක 08 පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව 59 වන අතර සහභාගී වූ ප්‍රධානාචාර්ය හා උප ප්‍රධානාචාර්ය වරුන්ගේ සංඛ්‍යාව 7,642 කි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල්. 600,000.00 වන අතර වියදම රුපියල් 5,800,000.00 කි.

## 05.2. දහම් සරසවිය පාඨමාලාව

2015 වර්ෂය සඳහා දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ ව පවත්වයි. ඒ සඳහා අනුමත ඇස්තමේන්තු ගත මුලු මුදල රු. 4,597,350.00 කි. දිවයින පුරා මධ්‍යස්ථාන 24 ක දී මෙම පාඨමාලාව පැවැත්වෙන අතර, පාඨමාලාව හැදැරීම සඳහා ගුරු භවතුන්ගෙන් මුදල් අය කිරීමක් සිදු නොකරයි. මේ වන විට විශ්වවිද්‍යාලය වෙත ඉහත ඇස්තමේන්තුවට අනුව රු. 2,699,109.71 ක මුදලක් ලබා දී ඇත.


2016 වර්ෂයේ මාර්තු මස තුළ පසුගිය වර්ෂයේ එනම්, 2013/ 2014 වර්ෂවල දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව සමත් කණ්ඩායම සඳහා උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී. එසේම 2016 වර්ෂයේ මෙම පාඨමාලාව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමඟ පැවැත්වීමට ද කටයුතු සූදානම් කරමින් පවතී.

2015 වර්ෂය සඳහා රු. 4,000,000.00 ක පමණ මුදලක් මෙම පාඨමාලාව සඳහා වෙන් කර තිබුණි. දේශකවරුන් සඳහා අදාළ දීමනා සඳහා රු. 1,800,000 ක් ද, සමාරම්භක උත්සවයේ කටයුතු සඳහා 190,000.00 ක් ද, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහා රු. 1,044,000.00 ක් සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය වෙත උපාධි ප්‍රදානෝත්සවයේ කටයුතු සඳහා රු. 821,381.50 ක් වෙන් කර දී ඇත. ඒ අනුව මුළු වියදම රු. 9,148,161.00 කි.



## 05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම.

පරපුරෙන් පරපුරට නිර්මල බුදු දහමේ හරය දායාද කිරීමේ මූලස්ථානය දහම් පාසලයි. බුදු දහමින් පෝෂිත පරපුරක් බිහි කිරීමට ඇප කැපව නිශ්ශරණාධ්‍යාශයෙන් කටයුතු කරන දහම් පාසල් ගුරු භවතුන් දිරිමත් කිරීමට හා ඔවුන්ට ගෞරවාන්විත සමාජ පරිසරයක් ගොඩනැගීම පිණිස දහම් පාසල් ගුරු හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි. 2015 වර්ෂයේදී දහම් පාසල් ගුරු හැඳුනුම්පත් 2,827 ක ප්‍රමාණයක් රුපියල් 224,236.66 ක වියදමින් සකස් කර ඇත.




රූපය 05.1 - දහම් පාසල් ගුරු හැඳුනුම්පතක ආදර්ශ ආකෘතියක්

## 05.4. බෞද්ධ විශ්වකෝෂය

බෞද්ධ විශ්වකෝෂයේ සුවි වෙළුමේ අවසන් සෝදුපත මුද්‍රණය කර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. එම සෝදුපත නැවත පරීක්ෂා කර බලා අවසන් මුද්‍රණයට සූදානම් කළ යුතු බැවින් එම කටයුතු සඳහා අවශ්‍ය ප්‍රධාන කර්තෘ, නියෝජ්‍ය කර්තෘ සහ සහකාර කර්තෘ යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා දී ඇති අතර, එම තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ දී රු. 1,300,000.00 ක මුදලක් වෙන් කර තිබූ අතර වියදම් කළ මුදල රු. 780,000.00 කි.

## 05.4. ත්‍රිපිටක පරිවර්තනය

ජාතක පාළි 1, 2 සහ 3 ග්‍රන්ථ මුද්‍රණය කර දෙපාර්තමේන්තුවට භාර දී ඇත. ඒවායේ මිල ගණන් නියම කර මේ වන විට අළෙවියට තබා ඇත.

මැදුම් සඟිය තෘතීය භාගය හා ආපදානපාළි I ග්‍රන්ථය මුද්‍රණ කටයුතු සිදු කරමින් පවතී. ත්‍රිපිටක පරිවර්තන කටයුතු සඳහා 2015 වර්ෂයට රු. 2,500,000.00 ක මුදලක් වෙන් කර තිබූ අතර, එම මුළු මුදල ම මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත.

# 06

# භික්ෂු ලියාපදිංචි අංශය

## 06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම.

මෙම අංශය මඟින් සිදුවන සේවාවන්...

- ❖ නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම
- ❖ නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- ❖ උපැවිදි සහතික නිකුත් කිරීම.
- ❖ සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- ❖ ලියාපදිංචි කරන ලද සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල සහතික පිටපත් නිකුත් කිරීම.
- ❖ සාමණේර සහ උපසම්පදා ලේඛන පරිගණක ගත කර යාවත්කාලීන කිරීම.
- ❖ නීතිමය ගැටලු වල දී අවශ්‍ය සාක්ෂි ලබා දීම.

2015 වර්ෂයේදී,

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 3,151 |
| ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 973 |
| නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව | - 1,200 |
| නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව | - 1,440 |

එමෙන්ම මෙම අංශය මඟින් සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු පරිගණක ගත කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. එම මෘදුකාංගය මඟින් දැනට උපසම්පදා භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු 14,303 ක් ද, සාමණේර ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු 25,714 ක් ද, දත්ත පද්ධතිය වෙත ඇතුළත් කර ඇත.

මෙමඟින් සාමණේර සහ උපසම්පදා සහතික පත් ඉල්ලුම් කරන අයට එම සහතික පත් ඉක්මනින් නිකුත් කිරීමට අවස්ථාව සැලසී ඇත.

# 07

# තොරතුරු අංශය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දිනය. නමුත් පසුගිය වසර 07 පුරාම තොරතුරු අංශය මඟින් දෙපාර්තමේන්තුවට ඉටුවිය යුතු සේවය මෙමඟින් සිදු විය. මෙම අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

## 07.1. ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික තොරතුරු ඒකරාශී කිරීම.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සියළුම විහාරස්ථාන වල තොරතුරු පරිගණක ගත කොට ඇත. එහිදී විහාරස්ථානය රජමහා විහාර, පුරාණ විහාර, මහා විහාර, බෞද්ධ මධ්‍යස්ථාන, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන ආරණ්‍ය සේනාසන ආදී වශයෙන් කාණ්ඩ ගත කිරීමක් සිදු කර ඇත. ඒ ඒ නිකායයන්ට අනුව තොරතුරු සකස් කිරීම ආරම්භ කොට ඇත.

සියලු දහම් පාසල් තොරතුරු පරිගණක ගත කිරීම ආරම්භ කොට ඇත.

## 07.2. තොරතුරු යාවත්කාලීන කිරීම

ඒ යටතේ පහත තොරතුරු යාවත්කාලීන කිරීම හා අලුත් තොරතුරු රැස් කිරීම සිදු කරනු ලබයි.

- ශ්‍රී ලංකාවේ විහාරස්ථාන නාමාවලිය සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා හා නිකායයන් පිළිබඳ තොරතුරු.
- විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් සංගණනයක් 2016 මුල් කාර්තුවේ දී සිදු කිරීමට සැළසුම් කර ඇත.

## 07.3. පාලි ප්‍රවර්ධන පාඨමාලාව

දහම් පාසල් ක්ෂේත්‍රයෙහි පාලි භාෂා දැනුම ඇති ගුරු භවතුන්ගේ පවතින හිඟයට විසඳුමක් ලෙසින් මෙම වැඩසටහන වාර්ෂිකව සිදු කරනු ලබයි. මෙහිදී පාලි භාෂා දැනුමෙන් දහම් පාසල් ගුරුවරයා පෝෂණය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදවීම මෙහි අපේක්ෂිත අරමුණයි. මීට අමතරව ත්‍රිපිටකය පරිශීලනය සඳහා ලැදියාවක් ඇති කිරීම ද මෙමඟින් සිදු වේ.




පාලි භාෂා දැනුමැති ප්‍රවීණයන් ලවා සකස් කළ විෂය නිර්දේශයක් ඇසුරෙන් සකස් කළ නිබන්ධන පාඨමාලා ලාභීන් වෙත සපයමින් දිවයිනේ දිස්ත්‍රික්ක 19 ක තෝරාගත් මධ්‍යස්ථාන 30 ක දී මෙම පාඨමාලාව සාර්ථකව සිදු කෙරේ. පාඨමාලා ලාභීන් සංඛ්‍යාව 1500 කි.

## 07.4. මාධ්‍ය කටයුතු සහ වෙනත් සේවාවන්.

- ❖ විවිධ අවශ්‍යතාවයන් අනුව සියලු මහජනයාගේ ප්‍රයෝජනය පිණිස රැස් කළ තොරතුරු සකස් කොට මුද්‍රා හරිනු ලබයි.

- ❖ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.buddhistdept.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම මෙම අංශයෙන් සිදු කරයි.




- ❖ දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන් සහ උත්සව අවස්ථා සඳහා පූර්ව ප්‍රචාරය, මාධ්‍ය ආවරණය, මාධ්‍ය සාකච්ඡා හා සියළුම මාධ්‍ය කටයුතු කරනු ලබයි.

# 08

# ගිණුම් අංශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා උන්නතිය සඳහා වන කාර්යයන් සහ කර්තව්‍යයන් මැනවින් කළමනාකරණය කොට ක්‍රියාත්මක කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරනු ලබන මුදල් වඩාත්ම යෝග්‍ය යැයි සැළකෙන ආකාරයට අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව යෙදවීම හා මුදල් යෙදවූ ආකාරය පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත මාසිකව හා වාර්ෂිකව ගිණුම් වාර්තා සැපයීම සහ භාණ්ඩාගාරය ඉල්ලා සිටින අනෙකුත් වාර්තා සැපයීම මෙහි කාර්යභාරය වේ

❖ <u>ගිණුම් අංශයේ සේවයේ නියුතු සංඛ්‍යාව -</u>

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | බෞද්ධ කටයුතු සමායෝජක | 01 |
| ගණකාධිකාරී | 01 | සංවර්ධන සහකාර | 01 |
| ශාඛා ප්‍රධානී | 01 | කළමනාකරණ සහකාර | 04 |
| ගිණුම් සහකාර | 02 | කාර්යාල කාර්ය සහයක | 01 |

| වැය විෂය | ඇස්තමේන්තුව | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | |
| දහම් පාසල් පොත් මුද්‍රණය හා බෙදා හැරීම 201-2-2-1-1501 | 80,000,000 | **79,799,619** | **200,381** |
| දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම 201-2-2-5-1508 | 20,464,000 | **17,510,072** | 2,953,928 |
| සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පවත්වා ගෙන යාම 201-2-2-0-1405*3 | 6,700,000 | **6,598,919** | 101,081 |
| බෞද්ධ භික්ෂූන් සඳහා දානය පිරිනැමීම 201-2-2-0-1405*7 | 1,615,890 | **1,615,890** | - |
| ජාතික සිල්මාතා සංගමය ක්‍රියාත්මක කිරීම 201-2-2-0-1405*7 | 2,051,412 | **2,051,412** | - |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම 201-2-2-0-1405*7 | 359,821 | **359,821** | - |
| ත්‍රිපිටක පරිවර්තනය හා මුද්‍රණය කිරීම 201-2-2-0-1405*2 | 2,090,000 | **2,086,361** | 3,639 |
| බෞද්ධ විශ්ව කෝෂ සම්පාදනය කිරීමේ කටයුතු 201-2-2-0-1405*6 | 1,300,000 | **780,000** | 520,000 |
| දහම් පාසල් ගුරුවරුන්ට නිල ඇඳුම් සැපයීම 201-2-2-2-1501 | 100,000,000 | **99,065,976** | 934,024 |
| උසස් බෞද්ධ විද්වතුන් සඳහා උපහාර දැක්වීම 201-2-2-0-1405*7 | 50,000 | **50,000** | - |
| බෞද්ධ කලා ශිල්ප වැඩි දියුණු කිරීම 201-2-2-0-1405*7 | 944,930 | **944,930** | - |
| සිසු නිපුණතා ඇගයීමේ වැඩසටහන 201-2-2-6-1508 | 16,536,000 | **16,252,785** | **283,215** |
| උපසම්පදා උත්සව 201-2-2-0-1405*1 | 2,750,000 | **2,141,151** | 608,849 |
| ආදාහන උත්සව 201-2-2-0-1405*5 | 2,460,000 | **2,416,000** | 44,000 |
| දහම් පාසල් ගුරුවරුන්ට පුස්තකාල දීමනා ලබා දීම 201-2-2-3-1501 | 170,000,000 | **152,624,785** | **7,375,215** |
| ජාතික වෙසක් උත්සවය 201-2-2-0-1405*7 | 215,456 | **215,456** | - |
| මූලධන වියදම් | | | |
| විහාරාධාර ගෙවීම 201-2-2-7-2502 | 45,000,000 | **43,917,107** | **1,082,893** |
| ශාසනාරක්ෂක මණ්ඩල සඳහා අවශ්‍ය උපකරණ සැපයීම 201-2-2-9-2502 | 4,000,000 | **3,865,321** | **134,679** |
| දහම් සරසවිය 201-2-2-11-2502 | 10,000,000 | **9,148,161** | **851,839** |
| දහම් පාසල් ගොඩනැගිලි ඉදි කිරීම 201-2-2-8-2502 | 14,000,000 | **13,308,183** | **691,817** |
| දහම් පාසල් උපකරණ සැපයීම 201-2-2-8-2502 | 14,000,000 | **13,308,183** | **691,817** |
| සිල්මාතා ආරාම ඉදි කිරීම 201-2-2-10-2502*2 | 7,000,000 | **6,978,111** | 21,889 |
| දක්ෂිණ ලංකා සිල්මාතා අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාම 201-2-2-10-2502*1 | 4,000,000 | **3,130,130** | **869,870** |
| දුෂ්කර විහාරස්ථාන නඩත්තු කිරීම සඳහා ආධාර ගෙවීම 201-2-2-7-2502 | 45,000,000 | **43,917,107** | **1,082,893** |

සටහන 08.1 - එක් එක් වැය විෂයට අදාලව 2015 වර්ෂයේදී ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වියදම් කළ ආකාරය

# 09

# අභ්‍යන්තර විගණන අංශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය සඳහා, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත මගින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමට සහාය වීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. මේ අනුව 2013.07.01 දින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදි.

<u>අරමුණු</u>

- අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීමට සහාය වීම.
- මනා ගිණුම් හා මූල්‍ය කළමනාකරණයට සහාය වීම.
- මනා සම්පත් භාවිතය තහවුරු කිරීමට සහාය වීම.
- කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට සහාය වීම.

මෙම අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්ය මණ්ඩලය සපුරා ගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු කරා යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

## 09.1. අභ්‍යන්තර විගණන අංශය මගින් 2015 වර්ෂයේ සිදු කළ සුවිශේෂී කාර්යභාරයන්

1. විහාර දේවාලගම් පනතේ විධිවිධාන අනුව සිද්ධස්ථානයක පවත්වා ගෙන යා යුතු ගිණුම් පොත්පත් පිළිබඳ හඳුන්වා දී ඒවායේ පාලන පද්ධතිය ශක්තිමත් කිරීම.
2. පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන විගණනයට ලක් කිරීම සහ එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබා දීම
3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
4. දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මගින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා දායකත්වය සහ සහයෝගය ලබා දීම.
5. දෙපාර්තමේන්තුවේ ඇති විශේෂ රාජකාරි සඳහා සහයෝගය ලබා දීම.

# 10

# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

## 10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය.

රත්නපුර, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්කයන් හි පිහිටි දෙපාර්තමේන්තුවට අයත් විහාර හා දේවාල වල බෞද්ධ කටයුතු කොමසාරිස් බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත්, කාර්ය පහසුවෙන් ඉටු කිරීමටත් රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මඟින් පුළුල් අවකාශයක් සැලසී ඇත.

විශේෂයෙන් 2015 වසර තුළ මෙම කාර්යාලය මඟින් ඉඩම් බදු දීම, බදු සංශෝධන කිරීම් හා දැව බලපත්‍ර නිකුත් කිරීමේ සේවාවන් වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කර ඇති අතර එහි සාපේක්ෂ වර්ධනයක්ද පෙන්නුම් කරයි. විහාරස්ථාන ගැටුම් නිරාකරණය හා මැණික් ගැරීම සඳහා බලපත්‍ර ලබා දීමද සිදු කරයි.

| රාජකාරි කටයුතු | දිස්ත්‍රික්කය | | | මුළු ගණන |
|---|---|---|---|---|
| | රත්නපුර | බදුල්ල | මොණරාගල | |
| භාරකරුවන් පත් කිරීම. | 05 | 03 | 09 | 17 |
| ඉඩම් බදු දීම | 45 | 175 | 68 | 288 |
| බදු මුදල් සංශෝධනය කිරීම | 25 | 250 | 30 | 305 |
| දැව හෙලීම හා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම | 210 | 27 | 225 | 442 |
| අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු මුදල් නිදහස් කිරීම | 08 | 02 | 05 | 15 |
| පූජා ඔප්පු ලබා දීමට අනුමැතිය ලබා දීම | 01 | 02 | 03 | 06 |
| වන්දි මුදල් පොලී නිදහස් කිරීම | 03 | - | - | 03 |
| විහාරස්ථාන සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම | 85 | 35 | 30 | 150 |
| විහාරස්ථාන ලියාපදිංචිය සඳහා මහානායක ස්වාමීන් වහන්සේලාට ලිපි යැවීම | 08 | 06 | 12 | 26 |
| මැණික් ගැරීමට බලපත්‍ර ලබා දීම නිර්දේශ කිරීම | 145 | - | 11 | 156 |
| මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම | 181 | - | 04 | 185 |

වගුව 10.1 - රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මඟින් 2015 වර්ෂයේ සිදු කරන ලද රාජකාරි

## 10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය.

**කාර්ය මණ්ඩලය**

| | | | |
|---|---|---|---|
| බෞද්ධ කටයුතු කොමසාරිස් (මහනුවර) | - 01 | බෞද්ධ කටයුතු සමායෝජක | - 04 |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | - 01 | සංවර්ධන නිලධාරී | - 05 |
| සහකාර නීති නිලධාරී | - 01 | රියැදුරු | - 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | - 04 | කාර්යාල සේවක සේවය | - 02 |

**මුළු නිලධාරීන් සංඛ්‍යාව 19**

<u>පාලන බල ප්‍රදේශය</u>

මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑළිය දිස්ත්‍රික්ක හා බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය, මහියංගන රජමහා විහාරය, මහියංගන සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන සිද්ධස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල | 4(1) යටතේ පාලනය නොවන සිද්ධස්ථාන |
|---|---|---|---|
| මහනුවර | 43 | 13 | 996 |
| මාතලේ | 08 | 01 | 338 |
| කෑගල්ල | 17 | 03 | 512 |
| නුවරඑළිය | 03 | 02 | 247 |
| බදුල්ල | 02 | 01 | - |
| එකතුව | 73 | 20 | 2,093 |

වගුව 10.2 - මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මඟින් පාලනය වන බෞද්ධ සිද්ධස්ථාන හා දේවාල

මෙම සිද්ධස්ථානවලට අදාළ සියලු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන අනුව මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර පාලනය වන විහාරස්ථාන සඳහා භාරකරුවන් පත් කිරීම, ශ්‍රී දළදා මාලිගාව, සතරමහා දේවාල, පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ, බස්නායක නිළමේවරු පත් කිරීමේ ඡන්ද කටයුතු, භාරකාර ඇප මුදල් තැන්පත් කිරීම සහ නිදහස් කිරීම, සිද්ධස්ථාන වල දේපළ භාරකරුවන්ට භාර දීම, විහාර දේවාල ඉඩම් බදු දීම, වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම සහ පරීක්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම, විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු, ශ්‍රී දළදා පෙරහැර, උපසම්පදා කටයුතු වලට සහාය වීම, දහම් පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගී වීම හා සහාය වීම විශේෂයෙන් සිදු කෙරේ.

2013 වර්ෂයේ අගෝස්තු මස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම කාර්යාලය ස්ථාපිත කිරීමෙන් පසුව 2014 වර්ෂය හැකිතාක් දුරට ක්‍රමවත්ව පවත්වාගෙන යාමට ඉඩකඩ සකස් කර ගන්නා ලද අතර කාර්යය මණ්ඩලයේ සහයෝගයෙන් වඩාත් ඵලදායීව වැඩකටයුතු වලට පහසු වන ආකාරයට ගොඩනගා ගැනීමට මේ වන විට හැකි වී තිබේ. ඒ අනුව 2015 වර්ෂයේ තවදුරටත් පහසුකම් පුළුල් කර ගැනීමේ අදහසින් ප්‍රධාන කාර්යාලයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන යොදාගෙන අළුතින් කබඩ් සවි කිරීම සහ උපකරණ මිලදී ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව කාර්යාලයේ සීමිත ඉඩ කඩ තුළ අවශ්‍ය සම්පත් යොදාගෙන නව දැක්මකින් යුතුව කටයුතු කිරීමට කාර්ය මණ්ඩලය දැඩි කැපවීමක් කර ඇත.

| | | |
|---|---|---|
| 1. | නිකුත් කර ඇති බදු අයදුම්පත් සංඛ්‍යාව | 880 |
| 2. | අවසන් කර ඇති බදු ඔප්පු | 275 |
| 3. | තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන | 147 |
| 4. | ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන | 46 |
| 5. | කාර්යාල පරීක්ෂණ ගණන | 71 |
| 6. | විහාරාධිපති තහවුරු කිරීම් ලිපි | 05 |
| 7. | භාරකරුවන් පත් කිරීමේ ලිපි | 20 |
| 8. | බස්නායක නිළමේවරුන් පත් කිරීම | 13 |
| 9. | භාණ්ඩ භාර දීම | 17 |
| 10. | මුදල් නිදහස් කිරීම | 21 |
| 11. | ගස් කැපීම | 90 |
| 12. | ශ්‍රමදාන | 05 |
| 13. | පඩුරු මුදල් රාජකාරි අවස්ථා | 73 |
| 14. | විභාගවෙමින් පවතින නඩු | 19 |
| 15. | අවසන් වූ නඩු | 01 |
| 16. | අවශ්‍ය වූ විට නැවත කැඳවීමට මුදා හැර ඇති නඩු | 02 |

2015 වර්ෂයේ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතින් පාලනය වන සිද්ධස්ථාන 20ක් සඳහා භාරකරුවන් පත් කිරීම, විහාරාධිපති ධූර තහවුරු කිරීම හා බස්නායක නිළමේවරුන් තෝරා පත් කර ගැනීමේ නිලවරණ 13ක් පවත්වන ලදි. භාරකරුවන් වෙත දේපළ භාරදීම, ඇප මුදල් තැන්පත් කිරීම හා අලුතෙන් පත් වූ භාරකරුවන් දැනුවත් කිරීම ද සිදු කරනු ලැබීය. පැරණි ඇප මුදල් නිදහස් කිරීම් කිහිපයක් ද සිදු විය.




සිද්ධස්ථාන සතු ගිණුම් කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා මෙම වර්ෂය තුළ භාරකරුවන් දැනුවත් කිරීමට විශාල කාර්යභාරයක් සිදු කෙරිණි. අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා නිසි කලට නොඑවන සහ ප්‍රමාද කිරීම් සිදු කරන භාරකරුවන්ට ලිපි මඟින් දැනුම් දීමට

අමතරව මෙම වර්ෂයේ මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා 2015 ඔක්තෝබර් මස 01 දින නාථ දේවාල ශ්‍රවණාගාරයේදී භාරකරුවන් 70 පමණ කැඳවා පවත්වන ලද සම්මන්ත්‍රණය ඉතාමත් සාර්ථක පියවරක් වූ බව සඳහන් කරමි. එසේම 2015 වර්ෂය තුළ සිද්ධස්ථාන වලට ගොස් පොත් පත් පරීක්ෂා කිරීම ද, අභ්‍යන්තර විගණන අංශයේ උපදෙස් පරිදි අඩුපාඩු සකස් කර ගැනීමට හා භාරකරුවන් දිරිමත් කිරීමට පවත්වන ලද සම්මන්ත්‍රණ වැඩසටහන් ද සාර්ථක පියවරක් විය.

මෙම වර්ෂය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණ 46 ක් හා කාර්යාල පරීක්ෂණ 75 ක් පමණ සිදු කර ඇති අතර මෙමඟින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට පියවර ගන්නා ලදි. මේ තුළින් බදු කරුවන්, භාරකරුවන්, ස්වාමීන් වහන්සේලා සමඟ සාකච්ඡා කර පවතින ගැටළු සඳහා සාර්ථක විසඳුම් ලබා දීමට පියවර ගත් බව සඳහන් කළ හැකිය. මෙහිදී සිද්ධස්ථාන වල රාජකාරි ඉඩම් සම්බන්ධවත් දේවාල වල කප්පු රාජකාරි ආරවුල් විසඳීම වැනි කටයුතු වලදීත්, බදු ඉඩම් සම්බන්ධ බදු ගෙවීම් පැහැර හැරීම, නීත්‍යානුකූලව බදු නොගැනීම සහ බදු මුදල් අභියාචනා යනාදිය ගැනද සළකා බලා ඒ සඳහා විසඳුම් ලබා දෙන ලදි.

2015 වර්ෂයේ නාගරික සීමාව තුළ හා ඉන් පිටත සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීම සම්බන්ධව ඔප්පු ලබා දීමේ කටයුතුවල සාර්ථක ප්‍රගතියක් පෙන්වා ඇත. ඒ අනුව බදු දීම සඳහා බදු අයදුම්පත් 880ක් නිකුත් කර ඇති අතර තක්සේරු වාර්තා ගෙන්වා ගැනීමට යවා ඇති ලිපි සංඛ්‍යාව 147 කි. දීර්ඝ කාලීනව ලබා දී ඇති බදු ඔප්පු සංඛ්‍යාව 275කි. එසේම සිද්ධස්ථාන වල ක්‍රියාත්මක බදු සම්බන්ධ වෙන වෙනම ලේඛන සකස් කොට පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමේ වැඩ පිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කොට ඇත. තවද වසර පහෙන් පහට බදු මුදල් සංශෝධනය කිරීම සම්බන්ධව ලිපිගොනු යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙල මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතියි. මීට අමතරව අදාල දිස්ත්‍රික්ක වල සියළුම සිද්ධස්ථාන වල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබා ගැනීම සහ එම තොරතුරු පරිගණක ගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතියි.

මෙම වර්ෂය තුළ ශ්‍රී දළදා මාලිගාව, සතර මහා දේවාලය හා අනෙකුත් සිද්ධස්ථාන වල පඬුරු මුදල් අධීක්ෂණ කටයුතු 73 ක් පමණ සිදු කරන ලදි. මෙහි දී නිලධාරීන් ක්‍රමවත් වැඩසටහනක් අනුව යොදවා වඩාත් නිවැරදිව මෙම කටයුතු ගණනය කිරීමෙහි ලා නිරතව ඇත. සිද්ධස්ථාන වල 2015 වාර්ෂික පඬුරු මුදල් වල එකතුව රු. 38,808,964.00 ක් දක්වා වර්ධනය කර ගැනීමට විධිමත් අධීක්ෂණයක් තුළින් හැකි විය.




2015 වර්ෂය තුළ සිද්ධස්ථාන වලට අදාළ ව මෙම කාර්යාලය සම්බන්ධ වූ නඩු ගණන 19 කි. ඉන් එක් නඩුවක් අවසන් ව ඇත. අවශ්‍ය වූ විට නැවත කැඳවීමට මුදා හැර ඇති නඩු ගණන 02 කි. නඩු වල දී අධිකරණයේ පෙනී සිටීම, නීතිපති උපදෙස් ගැනීමත්, සිද්ධස්ථාන භාරකරුවන්ට/ ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය

නීති උපදෙස් සහකාර නීති නිලධාරි මහින් ලබා දෙමින් නඩු කටයුතු සීමා කර ගැනීමට කටයුතු කිරීම සඳහා මහ පෙන්වීම් සිදු කර ඇත.

ඵලදායිතාවට සම්බන්ධ කටයුතු සහ කාර්යාලයේ සුබසාධනය සඳහා කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ම එක්ව ශ්‍රමදාන 05ක් පමණ පවත්වන ලදි. මෙහි දී කාර්යාලය සතු ලිපි ගොනු ක්‍රමවත් ව අසුරා තැබීම වැනි කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ විශේෂ සහායක් ලැබිණි. 2014 වර්ෂයේ අලුතින් පරිගණක පද්ධතියක් සැකසීම සහ ලිපි ගොනු ගබඩා පහසුකම් සැපයීම නිසා ක්‍රමවත් ව හා වඩාත් කාර්යක්ෂමව කාර්යාල කටයුතු පවත්වා ගෙන යාමෙන් 2015 වර්ෂයේ වඩාත් ඵලදායී ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය.

| අනු අංකය | සිද්ධස්ථානය | වාර ගණන | වර්ෂය තුළ මුදල් එකතුව |
|---|---|---|---|
| 01 | ශ්‍රී දළදා මාලිගාව | 19 | 20356680.00 |
| 02 | මහනුවර විෂ්ණු දේවාලය | 03 | 349261.00 |
| 03 | මහනුවර පත්තිනි දේවාලය | 06 | 1486812.00 |
| 04 | මහනුවර නාථ දේවාලය | 02 | 238005.00 |
| 05 | මහනුවර කතරගම දේවාලය | 11 | 2955490.00 |
| 06 | ඇම්බැක්ක කතරගම දේවාලය | 02 | 375971.00 |
| 07 | මුතියංගණ රජමහා විහාරය | 02 | 473250.00 |
| 08 | රංගිරි දඹුළු රජමහා විහාරය | 02 | 1669683.00 |
| 09 | හඟුරන්කෙත විෂ්ණු දේවාලය | 01 | 247740.00 |
| 10 | ගැටඹේ රාජෝපවනාරාමය | 11 | 3927293.00 |
| 11 | මහියංගණ සමන් දේවාලය | 03 | 2492900.00 |
| 12 | දොඩන්වල නාථ දේවාලය | 03 | 430543.00 |
| 13 | මහියංගන රජමහා විහාරය | 01 | 408000.00 |
| 14 | අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය | 05 | 2947715.00 |
| 15 | මැදගොඩ පත්තිනි දේවාලය | 01 | 248591.00 |
| 16 | ලංකාතිලක විෂ්ණු දේවාලය | 01 | 201030.00 |
| | එකතුව | 73 | 38,808,964.00 |

වගුව 10.3 – 2015 වර්ෂය තුළ සිද්ධස්ථාන වල පඬුරු මුදල් ඉවත් කිරීම.